# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
# පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තු - අධ්‍යක්ෂ (නීති) HM 1-2

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත මගින් ස්ථාපිත කරන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවත්නා ඉහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)

### අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් නීති (LLB) ප්‍රථම උපාධියක් ලබා තිබීම හා නීතිඥයෙකු වීම,

   සමග

   නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම්,

   සහ

   තනතුරට අදාළව, නීති කටයුතු ක්ෂේත්‍රයේ අවම වසර දහතුනක පළපුරුද්ද හෝ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක ක්‍රියාකාරී පර්චයක් සතුවීම.

2. නීතිඥයෙකු වීම සමග නීති ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම්,

   සහ

   තනතුරට අදාළව නීති කටයුතු ක්ෂේත්‍රයේ අවම වසර දහතුනක (13) පළපුරුද්ද හෝ සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක ක්‍රියාකාරී පරිචයක් සතු වීම.

## අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

### අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

### සේවා පළපුරුද්ද :

2. තනතුරට අදාළව නීති ක්ෂේත්‍රයේ "කළමනාකරු මට්ටමේ" (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක් (05) සම්පූර්ණ කොට තිබීම හා නීතිඥයෙකු ලෙස දිව්රුම්දී තිබීම.

**වැටුප් පරිමාණය** : අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වේ.
HM 1-2 රුපියල් 81,670-15X2,270-115,720 + ජීවන අංක දීමනාව,
වෘත්තිය දීමනාව - (අංක 5/2017 දරන MSD චක්‍රලේඛය ප්‍රකාරව වේ.

### වයස් සීමාව :

වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

### තනතුරට අදාළ පොදු කොන්දේසි :

- තෝරාගත් අයදුම්කරුවන් විසින් තම වැටුපෙන් සේවක අර්ථ සාධක අරමුදල (EPF) සඳහා 10% දායකත්වයක් ලබාදිය යුතු අතර, කාර්යාංශය විසින් එම අරමුදල සඳහා 15% ක දායකත්වයක් ලබා දෙනු ලබන අතර, එයට අමතරව සේවක භාර අරමුදල (ETF) සඳහා 3% ක දායකත්වයක් ලබා දෙනු ලැබේ.
- පවත්නා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 1/2015 ප්‍රකාරව අනුමත කළ ඉන්ධන දීමනාව සමග වෙන්කළ වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් හිමිවේ.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමයට හිමිකම ඇත.
- බාහිර රෝගී වෛද්‍ය ලදුපත් සඳහා මුදල් ප්‍රතිපූර්ණයට හිමිකම ඇත.
- රාජ්‍ය සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මගින් යොමුකළ යුතුවේ.
- අයදුම්කරු පිළිබඳව විමසීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.
- අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට යා කොට තිබිය යුතුය.

අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට, පහත සඳහන් ලිපිනය වෙත, ලියාපදිංචි තැපෑලෙන්, 2020-12-07 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි.

**සභාපති,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**